# ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම
# THE ORIENTAL STUDIES SOCIETY OF SRI LANKA

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ පරීක්ෂණ පිළිබඳ

# විෂය නිර්දේශ

**2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.**

Examinations of the Oriental Studies of Sri Lanka
Conducted by the Department of Sri Lanka

# *Syllabuses*

Continued from 2017.

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.
Ministry of Education
Isurupaya, Battaramulla.

## ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය
## සිංහල විෂයය
ප්‍රශ්න පත්‍ර දෙක (02) යි.
## 1 වැනි පත්‍රය - නිර්දිෂ්ට ග්‍රන්ථ

| | | | |
|---|---|---|---|
| 1. | **පූජාවලිය** | - | 18, 20, 22, 23, 29 පරිච්ඡේද |
| 2. | **හංස සන්දේශය** | - | |
| 3. | **රොසලින් ජයතිස්ස හෙවත් වාසනාවන්ත විවාහය** | - | පියදාස සිරිසේන |
| 4. | **නවකවි සරණිය** | - | විමල් දිසානායක |

නිර්දිෂ්ට ග්‍රන්ථවල අර්ථාවබෝධය, අන්තර්ගතය හා ඓතිහාසික, සාමාජික පසුබිම පිළිබඳ මනා දැනුමක් අපේක්ෂිතයි.

## 2 වැනි පත්‍රය - ව්‍යාකරණ හා වාක්‍ය රචනය

(අ) සිදත් සඟරාව ආශ්‍රිතව සිංහල ව්‍යාකරණය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද ලේඛන ව්‍යවහාරයේ සම්ප්‍රදායානුකූල යෙදුම් පිළිබඳ මනා දැනුමක් ද අපේක්ෂිතයි.

මතු දැක්වෙන මාතෘකා පිළිබඳ අවධානය යොමු කරමින් සිංහලයේ ලේඛන ව්‍යවහාරය පිළිබඳව මනා දැනුමක් අපේක්ෂිතයි.

- සිංහල වර්ණමාලාව
- අක්ෂර වින්‍යාසය
- පද සාධනය
- වාක්‍ය වින්‍යාසය හා සම්ප්‍රදායානුකූල යෙදුම්

(ආ) දෙනු ලබන මාතෘකා කීපයකින් එකක් තෝරාගෙන වචන 350 ක පමණ ලේඛන ව්‍යාකරණානුකූලව වාක්‍ය රචනයක් ලිවීම.

## පරිශීලනීය ග්‍රන්ථ

| | | | |
|---|---|---|---|
| 1. | **පද නීතිය** | - | වේරගම පඬිතුමා |
| 2. | **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** | - | පී. තේනබදු |
| 3. | **සිංහල වහර අත්පොත** | - | පී. රූපසිංහ පෙරේරා |
| 4. | **රතනසාර ව්‍යාකරණය** | - | දෙහිගස්පේ පඤ්ඤාසාර නාහිමි |
| 5. | **උසස් පන්ති සිංහල ව්‍යාකරණය** | - | හොරණ වජිරඤාණ නාහිමි |
| 6. | **සිංහල ලේඛන රීතිය** | - | ජාතික අධ්‍යාපන ආයතනය |

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය

# පාලි විෂය

ප්‍රශ්න පත්‍ර දෙක (2) යි.

## 1 වැනි පත්‍රය - පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ

**1.** **මහාවග්ගපාළි - මහාක්ඛන්ධකය - මුල සිට දෙවැනි බණවර අවසනට**

(මහාවග්ගපාළි I (ප්‍රථම භාගය), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 1-50 පිටු)

**2.** **සංයුත්ත නිකාය - සගාථකවග්ග - බ්‍රාහ්මණ සංයුත්තය**

(සංයුත්ත නිකාය I (ප්‍රථම භාගය), බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 286-330 පිටු)

**3.** **ජාතකට්ඨකථා - කුලාවක වර්ගයේ පහත සඳහන් ජාතකකථා.**

i. **කුලාවක ජාතකය (174 - 180 පිටු),** ii. **වට්ටක ජාතකය (185 - 187 පිටු),**

iii. **තිත්තිර ජාතකය (189 - 191 පිටු),** iv. **බක ජාතකය (192 - 195 පිටු),**

v. **ඛදිරංගාර ජාතකය (197 - 203 පිටු).**

(ජාතකට්ඨකථා I (ප්‍රථම භාගය), හේවාවිතාරණ අට්ඨකථා මුද්‍රණය)

**4.** **ධම්මපදය - 1 - 10 වග්ග**

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, නියමිත කොටස්වල අර්ථාවබෝධය, ධර්මවිනය ඥානය, සාහිත්‍යමය අගය, ඓතිහාසික, සංස්කෘතික හා සාමාජික පසුබිම යන කරුණු පිළිබඳ ව ප්‍රාමාණික දැනුමක් අපේක්ෂිත යි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

1. **පන්සිය පනස් ජාතක පොත් වහන්සේ** - ආනන්ද කුලසූරිය
2. **පාලි සාහිත්‍යයේ ඉතිහාසය**, පරිවර්තනය: පූජ්‍ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
3. **බුදුරජාණන් වහන්සේ හා බ්‍රාහ්මණ සමාජය**, පූජ්‍ය රද්දැල්ලේ පඤ්ඤාලෝක අනුනාහිමි, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 2008.

## 2 වැනි පත්‍රය - පාලි ව්‍යාකරණ හා පරිවර්තන

(අ) බාලාවතාරයට විශේෂ අවධානය යොමු කරමින් පාලි භාෂාවේ වර්ණමාලාව, සන්ධි, නාම, නිපාත, උපසර්ග, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, විශේෂණ විශේෂ්‍ය, කාරක ප්‍රයෝග හා පාලි වාක්‍ය ක්‍රම යන මාතෘකාවලට විශේෂ අවධානය යොමු කරමින් සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණයේ අන්තර්ගත මූලික කරුණු පිළිබඳ ව ප්‍රාමාණික දැනුමක් මෙහි දී අපේක්ෂිත යි.

(ආ) සම්මත ව්‍යාකරණ රීති උල්ලංඝනය නො කොට, අනිර්දිෂ්ට පාලි ගද්‍ය හා පද්‍ය පාඨ සිංහල භාෂාවට ද, සිංහල පාඨ පාලි භාෂාවට ද නිවැරදි ව පරිවර්තනය කිරීමේ කුශලතාව පරීක්ෂා කරනු ලැබේ.

**පරිශීලනීය ග්‍රන්ථ :**


1. **තත්වදීපිකා නම් බාලාවතාර විස්තර වර්ණනාව,** පූජ්‍ය යගිරල පඤ්ඤානන්ද නාහිමි, 1936.
2. **බාලාවතාරටීකා,** පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, (නැවත මුද්‍රණය), ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2011.
3. **පාලි ගද්‍ය පද්‍ය රචනා,** පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි, අනුල මුද්‍රණාලය, කොළඹ 10, 1962.
4. **සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණ, පූජ්‍ය** වැගම පියරතන හිමි, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම, 2011.
5. **පාලි භාෂාවතරණය I, II සහ III කාණ්ඩ**, පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 1999.
6. **පාලි ව්‍යාකරණ විවරණය,** පූජ්‍ය මයිලැවේ සිරිනිවාස නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ, 1992.
7. **පාලි සංග්‍රහය,** අශෝක කරුණාරත්න, ඇම්.ඩී. ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1964.
8. **බාලාවතාරය,** සංස්කරණයː ආරියදාස වික්‍රම සෙනෙවිරත්න, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ, 1999.
9. **පාලි පාඨසංගහො,** ඩබ්ලිව් එෆ්. වික්‍රමසේකර, කොළඹ, 1962.

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය

# සංස්කෘත විෂයය

ප්‍රශ්න පත්‍ර දෙක (02) යි

## 1 වැනි පත්‍රය - සංස්කෘත නිර්දිෂ්ට ග්‍රන්ථ

1. පඤ්චතන්ත්‍ර - මිත්‍රසම්ප්‍රාප්ති
2. පද්‍යචූඩාමණී - 3, 4, 5 සර්ග
3. වෛරාග්‍ය ශතක - සම්පූර්ණ පොත

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය නියමිත කොටස්වල අර්ථාවබෝධය සාහිත්‍යමය අගය, ඓතිහාසික හා සාමාජික පසුබිම යන කරුණු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂිතයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

1. **පඤ්චතන්ත්‍ර ව්‍යාඛ්‍යා** - පූජ්‍ය දීපේගොඩ චන්ද්‍රවිමල හිමි
2. **පඤ්චතන්ත්‍ර අපරීක්ෂිත කාරක ප්‍රස්තාවනා** - විමල් ජී. බලගල්ලේ

## 2 වැනි පත්‍රය - ව්‍යාකරණ හා පරිවර්තනය

(අ) සාරස්වතයට විශේෂ අවධානය යොමුකරමින් සංස්කෘත භාෂාවේ වර්ණමාලාව, සංඥා, සන්ධි, නාම, සමාස, අව්‍යය, තද්ධිත, ආඛ්‍යාත, කෘදන්ත, කාරක ප්‍රයෝග යන සාම්ප්‍රදායික සංස්කෘත ව්‍යාකරණයේ අන්තර්ගත මූලික කරුණු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් මෙහි දී අපේක්ෂා කෙරේ.

(ආ) අනිර්දිෂ්ට සංස්කෘත පාඨ සිංහල භාෂාවට ද සිංහල පාඨ සංස්කෘත භාෂාවට ද නිවැරදිව පරිවර්තනය කිරීමේ කුසලතාව පරීක්ෂා කෙරේ. සංස්කෘත පාඨ ලිවීමේ දී දේව නාගරී අක්ෂර භාවිත කළ යුතුය. භාෂා රීතිය හා සම්ප්‍රදාය ආරක්ෂා කිරීම අනිවාර්ය වේ.

**පරිශීලනීය ග්‍රන්ථ :**

1. **සන්න සහිත සාරස්වත ව්‍යාකරණය** - පූජ්‍ය කහවේ රතනසාර හිමි
2. **සරල සංස්කෘත ශික්ෂක** - පූජ්‍ය බලංගොඩ ආනන්දමෛත්‍රෙය නාහිමි
3. **සංස්කෘත ව්‍යාකරණ තරංගිණී** - පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි
4. **සංස්කෘත ශික්ෂකය 1** - එම්.එච්.එෆ්.ජයසූරිය
5. **අභිනව පාඨාවලී** - පූජ්‍ය කෙරමිණියේ ජිනානන්ද හිමි
6. **සංස්කෘත ප්‍රවේශ ගද්‍යාවලී** - පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි
7. **සංස්කෘත 5 වසර** - පිරිවෙන් පෙළ පොත, අධ්‍යාපන අමාත්‍යාංශය

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය
# ප්‍රාචීන මධ්‍යම විභාගය
# සිංහල විෂයය

ප්‍රශ්න පත්‍ර දෙක (03) යි.

## 1 වැනි පත්‍රය - නිර්දිෂ්ට ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 1. **බුත්සරණ** | - | අංගුලිමාල දමනය, ආලවක දමනය හා වෙස්සන්තර ජාතකය |
| 2. **ථූපවංසය** | - | සම්පූර්ණ පොත |
| **3. මුවදෙව්දාවත** | - | සම්පූර්ණ පොත |
| **4. මයූර සන්දේශය** | - | සම්පූර්ණ පොත |

නියමිත ග්‍රන්ථවල අර්ථාවබෝධය, සාහිත්‍යික අගය හා ඓතිහාසික, සාමාජික අගය පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂිතයි.

## 2 වැනි පත්‍රය - ව්‍යාකරණ හා ඡන්දෝලංකාර

(අ) **සිදත් සඟරාව පිළිබඳ** සවිස්තර හා විචාරාත්මක දැනුමක් ද සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණ පිළිබඳ ව්‍යවහාරික දැනුමක් ද අපේක්ෂිතයි.

(ආ) **එළුසඳැස් ලකුණ** හා **සියබස්ලකර** ඇසුරෙන් සිංහල සාහිත්‍යයෙහි භාවිත වන ඡන්දස් හා කාව්‍යාලංකාර පිළිබඳ දැනුමක් අපේක්ෂිතයි.

(අ) කොටස යටතේ එළුසඳැස් ලකුණේ හා සියබස්ලකරේ ඇතුළත් ඡන්දස් හා කාව්‍යාලංකාර පිළිබඳ අවබෝධය මෙන්ම සිංහල පද්‍ය සාහිත්‍යයෙහි විවිධ ඡන්දස් හා කාව්‍යාලංකාර අනුව රචිත නිර්මාණ හඳුනා ගැනීම හා විග්‍රහ කිරීම පිළිබඳ දැනුමක් ද අපේක්ෂිතයි.

### පරිශීලනීය ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 1. **සිදත් සඟරාව** | - | |
| 2. **ව්‍යාකරණ විවරණය** | - | කුමාරතුංග මුනිදාස |
| 3. **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය** | - | විමල් ජී. බලගල්ලේ |
| 4. **සිංහල භාෂාධ්‍යයන ලිපි 1** | - | විමල් ජී. බලගල්ලේ |
| 5. **සිංහල භාෂාව - 15 වැනි පරිච්ඡේදය** | - | තියඩෝර් ජී. පෙරේරා පියතුමා |
| 6. **සිංහල ව්‍යාකරණ අකාරාදිය** | - | පී. රූපසිංහ පෙරේරා |
| 7. **සිංහල භාෂාවේ ව්‍යාකරණය** | - | ඩබ්ලිව්. එස්. කරුණාතිලක |
| 8. **සාහිත්‍යය** | - | හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි |
| 9. **සිංහල කාව්‍යය හා ඡන්දස් ශාස්ත්‍රය** | - | රත්න විජේතුංග |

## 3 වැනි පත්‍රය - සාහිත්‍ය ඉතිහාසය

දඹදෙණි යුගයේ පටන් මහනුවර යුගයේ අවසානය තෙක් සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂිතයි.

### පරිශීලනීය ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 1. **සිංහල සාහිත්‍ය කථා 2,3** | - | කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි |
| 2. **සිංහල සාහිත්‍යය 2,3** | - | ආනන්ද කුලසූරිය |
| 3. **සිංහල සාහිත්‍යයේ නැගීම** | - | මාර්ටින් වික්‍රමසිංහ |
| 4. **සිංහල සාහිත්‍ය වංශය (අදාළ කොටස)** | - | පී. බී. සන්නස්ගල |
| 5. **සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය** | - | නිවන්දම ධර්මකීර්ති හිමි |
| 6. **සාහිත්‍ය ලංකා** | - | කොත්මලේ අමරවංශ හිමි |
| 7. **සිංහල සාහිත්‍ය** | - | සී. ඊ. ගොඩකුඹුර |

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන මධ්‍යම විභාගය

# පාලි විෂයය

**ප්‍රශ්න පත්‍ර තුන (3) යි.**

## 1 වැනි පත්‍රය - පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ

1 **මජ්ඣිමනිකාය - පහත සඳහන් සූත්‍ර.**

1. **මහාදුක්ඛක්ඛන්ධ සුත්ත** (මූලපණ්ණාසකය, සීහනාදවග්ග, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 200 - 214 පිටු),
2. **අලගද්දූපම සුත්ත** (මූලපණ්ණාසකය, ඕපම්මවග්ග, 324 - 354 පිටු),
3. **රථවිනීත සුත්ත** (මූලපණ්ණාසකය, ඕපම්මවග්ග, 362 - 372 පිටු),
4. **පියජාතික සුත්ත** (මජ්ඣිමපණ්ණාසකය, රාජවග්ග, 530 - 538 පිටු),
5. **ඉන්ද්‍රියභාවනා සුත්ත** (උපරිපණ්ණාසකය, සළායතනවග්ග, 616 - 624 පිටු).

2 **ථේරගාථා - සත්තක, අට්ඨක, නවක හා දසක (7, 8, 9, 10) නිපාත**

(ථේරගාථාපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 134 - 163 පිටු)

3 **පාලි ථූපවංසය - ආරම්භයේ සිට මහියංගණථූපකථා අවසනට**

4 **තෙලකටාහගාථා - සම්පූර්ණයෙන්**

(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සංස්කරණය, තරංජි ප්‍රින්ටර්ස්, 2007.)

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, නියමිත කොටස්වල අර්ථාවබෝධය, ධර්මඥානය, සාහිත්‍යමය අගය, ඓතිහාසික හා සාමාජික පසුබිම, විශේෂයෙන් පාලි වංසකථා සාහිත්‍යයේ ආරම්භය හා ව්‍යාප්තිය යන කරුණු පිළිබඳ ව විචාරාත්මක දැනුමක් අපේක්ෂිත යි.

**පරිශීලනීය ග්‍රන්ථ :**


1. **පාලි වංසකථා සාහිත්‍යය**, පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2009.
2. **පාලි සාහිත්‍යය,** පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2002.
3. **පාලි සාහිත්‍යයේ ඉතිහාසය**, භරතසිංහ උපාධ්‍යාය, පරිවර්තනය: පූජ්‍ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
4. **බෞද්ධ සාහිත්‍යය**, පූජ්‍ය බද්දේගම විමලවංස අනුනාහිමි,
5. **ලංකා පාලි සාහිත්‍යය**, ජී. පී. මලලසේකර, ඇම්.ඩී.ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1964.
6. **ත්‍රිපිටක පරීක්ෂණය**, පූජ්‍ය හිත්තැටියේ උදිත නාහිමි, මාතර, 1956.

## 2 වැනි පත්‍රය - පාලි ව්‍යාකරණ හා වාක්‍ය රචනා

(අ) රූපසිද්ධිය හෝ පයෝගසිද්ධිය ඇසුරෙන් පාලි භාෂාවේ වර්ණමාලාව, සන්ධි, නාම, නිපාත, උපසර්ග, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, විශේෂණ විශේෂ්‍ය, කාරක ප්‍රයෝග හා පාලි වාක්‍ය ක්‍රම යන මාතෘකාවලට විශේෂ අවධානය යොමු කරමින් සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණයේ අන්තර්ගත මූලික කරුණු පිළිබඳ ව විස්තරාත්මක දැනුමක් අපේක්ෂිත යි.

(ආ) දෙනු ලබන මාතෘකාවක් අනුව වචන 250කට නොඅඩු පාලි ගද්‍ය රචනයක් ලිවීම.

**පරිශීලනීය ග්‍රන්ථ :**


1. **මහාරූපසිද්ධි**, සංස්කරණයඃ පූජ්‍ය කලුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමි, ගුණසේන මුද්‍රණාලය, කොළඹ.
2. **පයොගසිද්ධි**, සංස්කරණයඃ පූජ්‍ය කෝදාගොඩ ඤාණාලෝක නාහිමි, ඩබ්.ඊ. බැස්ටියන් සහ සමාගම, කොළඹ.
3. **මහාරූපසිද්ධි සන්නය**, සංස්කරණයඃ පූජ්‍ය මැදගම සුමංගල හිමි හා පූජ්‍ය බද්දේගම ධම්මරතන හිමි, සත්‍යසමුච්චය යන්ත්‍රාලය, පෑලියගොඩ.
4. **රූපසිද්ධි ප්‍රමෝදිනී,** පූජ්‍ය ලේල්වල අරියජොති නාහිමි සහ පරදුව පදුමජොති නාහිමි, ඇම්.ඩී. ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1964.
5. **පාලි ව්‍යාකරණ,** පූජ්‍ය පල්ලත්තර සුමනජොති නාහිමි, ගොඩගේ පොත් මැඳුර, 2008.
6. **පාලි ව්‍යාකරණ විවරණය,** පූජ්‍ය මයිලැවේ සිරිනිවාස නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ.
7. **සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණ, පූජ්‍ය** වැගම පියරතන හිමි, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම, 2011.

## 3 වැනි පත්‍රය - පාලි සාහිත්‍ය ඉතිහාසය හා ඡන්දෝලංකාර

(අ) ත්‍රිපිටක සාහිත්‍යයේ ව්‍යුහය සහ අන්තර්ගතය, බුද්ධභාෂිත හා ශ්‍රාවකභාෂිත, ධම්මවිනය හා නවංගසත්ථුසාසනය පිළිබඳ ව සපයා ඇති අර්ථකථන, පාලි ත්‍රිපිටකයෙහි පද්‍ය භාවිතය හා ඒවායේ සාහිත්‍යමය අගය යන මාතෘකාවන් පිළිබඳ අධ්‍යයනයක් මෙහි දී අපේක්ෂිත යි.

(ආ) පාලි ත්‍රිපිටකයේ අට්ඨකථා ලක්ෂණ, පාලි අට්ඨකථාවන්ගේ ප්‍රභවය හා ව්‍යාප්තිය, පාලි අට්ඨකථාවන්ට මූලාශ්‍රය වූ හෙළටුවා සාහිත්‍යය, ත්‍රිපිටකාගත ග්‍රන්ථවලට ලියන ලද අට්ඨකථා හා අට්ඨකථාචාර්යවරු, අර්ථකථන විධි, මහාවිහාරික දායකත්වය, පාලි අට්ඨකථාවලින් හෙළිවන ව්‍යාකරණ ලක්ෂණ, ඓතිහාසික, දේශපාලනික, සංස්කෘතික හා සාමාජික තොරතුරු යන මාතෘකාවන් පිළිබඳ අධ්‍යයනයක් මෙහි දී අපේක්ෂිත යි.

(ඇ) **වුත්තොදය** ඇසුරින් පාලි පද්‍යකරණයේ මූලිකාංග, වර්ණ ඡන්දස් හා මාත්‍රා ඡන්දස්, ෂට් ප්‍රත්‍යය යන කරුණු පිළිබඳ ව විධිමත් දැනුමක් ද, වර්ණ හා මාත්‍රා ඡන්දස්වල ලක්ෂ්‍ය, ලක්ෂණ පිළිබඳ ව විශේෂ අවබෝධයක් ද අපේක්ෂා කෙරේ.

(ඈ) **සුබොධාලංකාරය** ඇසුරින් පාලි අලංකාර ශාස්ත්‍රයට අදාළ මූලික කරුණු, කාව්‍ය දෝෂ හා දෝෂ පරිහාරය, කාව්‍ය ගුණ හා අලංකාර, නවනාට්‍ය රස හා රසභාව යන කරුණු පාලි සාහිත්‍යයෙහි එන නිදසුන් සහිත ව විධිමත් ව අධ්‍යයනය කිරීම මෙහි දී අපේක්ෂිත යි.

### පරිශීලනීය ග්‍රන්ථ


1. **පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය,** පූජ්‍ය වැගම පියරතන හිමි, සමයවර්ධන, 2004.
2. **පාලි අට්ඨකථා සහ ආචාර්යවරු,** පූජ්‍ය ගෝණදෙනියේ පඤ්ඤාරතන හිමි, කොළඹ, 2010.
3. **පාලි අට්ඨකථා සාහිත්‍යය**, පූජ්‍ය ලබුහේන්ගොඩ චන්දරතන හිමි, සමයවර්ධන මුද්‍රණාලය, 2006.
4. **පාලි සාහිත්‍යය i, ii** පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2002.
5. **පාලි සාහිත්‍යයේ ඉතිහාසය**, භරතසිංහ උපාධ්‍යාය, පරිවර්තනයː පූජ්‍ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
6. **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය**, ඊ.ඩබ්. අදිකාරම්, කොළඹ, 1963.
7. **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**, පූජ්‍ය වල්පොල රාහුල හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1999.
8. **ලංකා පාලි සාහිත්‍යය**, ජී. පී. මලලසේකර, ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1964.
9. **වුත්තොදය**, සංස්කරණයː පූජ්‍ය ලබුගම ලංකානන්ද මහානාහිමි, විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1946.
10. **සුබොධාලංකාරය,** සංස්කරණයː පූජ්‍ය ලබුගම ලංකානන්ද මහානාහිමි, විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1937
11. **කාව්‍ය රසය හා භාෂාව,** පණ්ඩිත පූජ්‍ය දෙනගම පියතිස්ස හිමි, කොළඹ.
12. Buddhist Commentarial Literature, C.R. Goonasekara, Kandy, 1967.
13. Pali Metre, A.K. Warder, London, 1967.

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන මධ්‍යම විභාගය

# සංස්කෘත විෂයය

ප්‍රශ්න පත්‍ර තුන (03) යි

## 1 වැනි පත්‍රය - සංස්කෘත නිර්දිෂ්ට ග්‍රන්ථ

1. **සෞන්දරනන්ද** - 1, 2 සර්ග
2. **දිව්‍යාවදාන** - සංසරක්ෂිතාවදාන, කුණාලාවදාන, අශෝකාවදාන, මාගන්දිකාවදාන
3. **දශකුමාරචරිතය** - උත්තර පීඨිකා
4. **ස්වප්නවාසවදත්තා** - සම්පූර්ණ පොත

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය නියමිත කොටස්වල අර්ථාවබෝධය, සාහිත්‍යමය අගය ඓතිහාසික හා සාමාජික පසුබිම යන කරුණු පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂිතයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

1. **සෞන්දරනන්ද කල්පලතා ව්‍යාඛ්‍යාව** - පූජ්‍ය වැලිවිටියේ සෝරත හිමි
2. **දිව්‍යාවදාන ප්‍රස්තාවනාව** - පූජ්‍ය අකුරටියේ අමරවංශ හිමි

## 2 වැනි පත්‍රය -ව්‍යාකරණ හා පරිවර්තනය

(අ) සාරස්වතය ආශ්‍රයෙන් සංස්කෘත භාෂාවේ **වර්ණමාලාව, සංඥා, සන්ධි, නාම, අව්‍යය, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කෘදන්ත, විශේෂණ, විශේෂ්‍ය හා කාරක ප්‍රයෝග** යනාදියට විශේෂ අවධානය යොමුකරමින් සංස්කෘත ව්‍යාකරණ පිළිබඳ විස්තරාත්මක හා විචාරාත්මක දැනුමක් මෙහි දී අපේක්ෂිතයි.

(ආ) **අනිර්දිෂ්ට සංස්කෘත පාඨ** සිංහල භාෂාවට ද **සිංහල පාඨ** සංස්කෘත භාෂාවට ද නිවැරදිව පරිවර්තනය කිරීමේ කුසලතාව පරීක්ෂා කෙරේ. සංස්කෘත පාඨ ලිවීමේ දී දේව නාගරී අක්ෂර භාවිත කළ යුතුය. භාෂා රීතිය හා සම්ප්‍රදාය ආරක්ෂා කිරීම අනිවාර්ය වේ.

(ඇ) දෙනු ලබන මාතෘකාවක් අනුව වචන 150 ට නොඅඩු වාක්‍ය රචනයක් දේවනාගරී අක්ෂරයෙන් ලිවීම අපේක්ෂිතයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

1. **සන්න සහිත සාරස්වත ව්‍යාකරණ** - පූජ්‍ය කහවේ රතනසාර නාහිමි
2. **සංස්කෘත ව්‍යාකරණ තරංගිණී** - පූජ්‍ය හෑගොඩ ධම්මින්ද නාහිමි
3. **සාරස්වත ප්‍රදීප** - පූජ්‍ය දමුණුමැයේ ඥාණරතන නාහිමි
4. **සාරස්වත විවරණය** - පූජ්‍ය තම්මැන්නාවැටියේ රතනජෝති හිමි
5. **සංස්කෘත පාඨාවලි** - එම්.එච්.එෆ්. ජයසූරිය

# 3 වැනි පත්‍රය - සාහිත්‍ය ඉතිහාසය හා ඡන්දෝලංකාර

(අ) බෞද්ධ සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය හා ලංකාවේ සංස්කෘත සාහිත්‍ය සංවර්ධනය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂිතයි.

(ආ) වෘත්තරත්නාකරය ආශ්‍රයෙන් සංස්කෘත ඡන්දස් වෘත්ත හා ෂට්ප්‍රත්‍යය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂිතයි.

(ඇ) කාව්‍යදර්ශය ආශ්‍රයෙන් රස, රසභාව, කාව්‍යදෝෂ, දෝෂ පරිහාර, කාව්‍ය ගුණ හා අලංකාර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

**පරිශීලනීය ග්‍රන්ථ :**

| | | | |
|---|---|---|---|
| 1. | **කාව්‍යදර්ශ** | - | පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමි |
| 2. | **වෘත්ත රත්නාකරය** | - | පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමි |
| 3. | **සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය** | - | ඒ. බෙරිඩේල් කීත්.<br>(පරිවර්තනය ජී.එස්.බී.සේනානායක) |
| 4. | **සංස්කෘත ග්‍රන්ථ වංශය** | - | පූජ්‍ය පොල්වත්තේ පඤ්ඤාලොක හිමි |
| 5. | **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය** | - | ජයදේව තිලකසිරි මහතා |
| 6. | **කාව්‍ය රසය හා භාෂාව** | - | පූජ්‍ය දෙනගම පියතිස්ස හිමි |
| 7. | **සංස්කෘත කාව්‍ය විචාර මූලධර්ම** | - | හේමපාල විජේවර්ධන මහතා |
| 8. | **කල්පලතා (ප්‍රස්තාවනාව)** | - | දර්ශන රත්නායක මහතා |

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන අවසාන (පණ්ඩිත) විභාගය
## සිංහල විෂයය

ප්‍රශ්න පත්‍ර හතර (04) යි.

**1 වැනි පත්‍රය - නිර්දිෂ්ට ග්‍රන්ථ**

| | | | |
|---|---|---|---|
| 1. | **සිඛවළඳ හා සිඛවළඳ විනිස** | - | ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය |
| 2. | **අමාවතුර** | - | ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය |
| 3. | **ධම්පියා අටුවා ගැටපදය** | - | යමකවග්ග අවසානයට |
| | | - | ඩී. ඊ. හෙට්ටිආරච්චි සංස්කරණය |
| 4. | **කව්සිළුමිණ** | - | එම්. බී. ආරියපාල සංස්කරණය |

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, අර්ථාවබෝධය හා ඓතිහාසික සාමාජික පසුබිම පිළිබඳ දැනීමක් ද අපේක්ෂිතයි.

## 2 වැනි පත්‍රය - භාෂාව හා ඉතිහාසය

(අ) නියමිත පුරා ලිපි
(ආ) සිංහල භාෂා ඉතිහාසය යනුවෙන් කොටස් දෙකකි.

(අ) **නියමිත පුරා ලිපි**

| | | |
|---|---|---|
| 1. | මිහින්තලේ ලෙන් ලිපි | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 5 වන වෙළුම, 210 පිටුව සිට |
| 2. | තෝනිගල ගිරි ලිපිය | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 3 වන වෙළුම, 172 පිටුව |
| 3. | නාගිරිකන්ද ගිරි ලිපිය | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 4 වන වෙළුම, 115 පිටුව සිට |
| 4. | 7, 8 සියවස්හි සෙල්ලිපි 07ක් | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 4 වන වෙළුම, 142 පිටුව සිට |
| 5. | සීගිරි ගී 201 - 250 තෙක් | |
| 6. | බදුලු ටැම් ලිපිය | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 5 වන වෙළුම, 182 පිටුව |
| 7. | මිහින්තලා පුවරු ලිපිය | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 1 වන වෙළුම, 98 පිටුව |
| 8. | පොළොන්නරු ගල්පොත සෙල් ලිපිය | - ලංකා ශිලා ලේඛන සංග්‍රහය, 2 වන වෙළුම, 98 පිටුව |

සිංහල භාෂා ඉතිහාසයේ වැදගත් යුග නියෝජනය වන පරිදි නියමිතව ඇති ඉහත දක් වූ පුරා ලිපි පිළිබඳව අවබෝධය සමග ඒවායේ භාෂා පරිණාම ලක්ෂණ අධ්‍යයනය අපේක්ෂිතයි.

(ආ) **සිංහල භාෂා ඉතිහාසය**

සිංහල භාෂාවේ ප්‍රභවයේ සිට වර්තමානය තෙක් භාෂාව පරිණාමය වූ අයුරු පිළිබඳව ඓතිහාසික වාග්විද්‍යානුකූල වූ දැනුමක් අපේක්ෂිතයි.

- සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳ මත :
  - සිංහලය කෙරෙහි බලපෑ හැකිව පැවති ලක්දිව ඇතුළත් භූගෝලීය කලාපයේ ප්‍රචලිත භාෂා පවුල්, ද්‍රවිඩ භාෂා ප්‍රභව මතය හා ඉන්දු ආර්ය භාෂා ප්‍රභව මත
  - මූල ඉන්දු යුරෝපීය භාෂා පවුලට සිංහලයේ ඇති ඥාතීත්වය

- සිංහල භාෂා ඉතිහාසයේ යුග බෙදුම
    - එක් එක් යුගයේ භාෂා පරිණාම ලක්ෂණ හා ශබ්ද යෝගාත්මක රීති, පුරාතන ඉන්දු ආර්ය ස්වර ශබ්ද/ ව්‍යඤ්ජන ශබ්ද සිංහලයට පරිණාමය වී ඇති ආකාරය සනිදර්ශනව සලකා බැලීම
- සිංහල පදක යෝගයේ හෙවත් පද සාධනයේ ඉතිහාසය, සිංහලයේ නාම ප්‍රකෘති ස්වරාන්ත හලන්ත භේදය ඇතිවීම හා ඊට තුඩු දුන් පරිණාම රීති, නාම වරනැගීමේ දී ලිංග, විභක්ති සංඛ්‍යා අතින් සිදු වූ ඓතිහාසික වෙනස්කම්, අනියමාර්ථ ප්‍රත්‍ය යෝගය, කාරක හා අකාරක විභක්ති, නාම ප්‍රභේද
- නියෝජ්‍ය නාම හෙවත් සර්ව නාම, සංඛ්‍යා නාම, ප්‍රත්‍යාර්ථ නාම නිපාත ලක්ෂණ හා නිපාත ප්‍රභේද, නිපාත ඉතිහාසය
- සිංහලයේ ක්‍රියා ප්‍රකෘති හෙවත් ධාතු ප්‍රකෘති, ආත්මනේ පද හා පරස්මෛ පද භේදය
- ආඛ්‍යාත ප්‍රත්‍යය : කාල, පුරුෂ, සංඛ්‍යා භේද අතින් ක්‍රියා වරනැගීමෙහි රැකී ඇති ඓතිහාසික ලක්ෂණ
- ශුද්ධ ආඛ්‍යාත රූප හා කෘදන්ත ආඛ්‍යාත රූප
- ක්‍රියා ප්‍රභේද : කර්තෘ කාරක, කර්ම කාරක
- සිංහල භාෂාව කෙරෙහි සංස්කෘතික සංස්පර්ශයේ බලපෑම

ඉහත දැක්වූ අනු මාතෘකා ඇතුළුව සිංහල භාෂා ඉතිහාසය පිළිබඳව මනා දැනුමක් අපේක්ෂිතයි.

### පරිශීලනීය ග්‍රන්ථ

1. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක - **සිංහල ශබ්ද කෝෂය** - 1 වැනි කාණ්ඩය, 1 කලාපය ප්‍රස්තාවනාව
2. විල්හෙල්ම් ගයිගර් - **සිංහල භාෂාවේ ව්‍යාකරණය** - The Grammar of the Sinhalese Language කෘතියේ සිංහල පරිවර්තනය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. විල්හෙල්ම් ගයිගර් - **සිංහල වාග් විද්‍යාත්මක ස්වරූපය** - Linguistic Character of Sinhalese නම් නිබන්ධනයේ සිංහල පරිවර්තනය විමල් ජී. බලගල්ලේ විසින්
4. විමල් ජී. බලගල්ලේ - **සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය** - එස්.ගොඩගේ ප්‍රකාශන
5. විමල් ජී. බලගල්ලේ - **සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය** - සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රකාශන
6. සෙනරත් පරණවිතාන - **සීගිරි ගී වියරණ කොටසේ සිංහල පරිවර්තනය**- එච්. එම්. පීටර්සිල්වා රාජ්‍ය භාෂා ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. විමල් ජී. බලගල්ලේ - **සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය** - ගොඩගේ ප්‍රකාශන

## 3 වැනි පත්‍රය - සාහිත්‍ය ඉතිහාසය

සිංහල සාහිත්‍යයේ ආරම්භයේ සිට මහනුවර යුගයේ අවසානය තෙක් සවිස්තර දැනුමක් අපේක්ෂිතයි.

### පරිශීලනීය ග්‍රන්ථ

1. **සාහිත්‍ය කථා** - 1, 2, 3 - පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි
2. **සිංහල සාහිත්‍ය** - 1, 2, 3, 4 - ආනන්ද කුලසූරිය
3. **සිංහල සාහිත්‍යය** - සී. ඊ. ගොඩකුඹුර
4. **සිංහල සාහිත්‍ය වංශය** - පුංචි බණ්ඩාර සන්නස්ගල
5. **කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය** - කේ.ඩී.පී.වික්‍රමසිංහ

## 4 වැනි පත්‍රය - ශ්‍රී ලංකාවේ ඉතිහාසය, පුරා විද්‍යාව හා සංස්කෘතිය

- ඓතිහාසික මූලාශ්‍රයන් ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ ඇති වූ දේශපාලනික, ආගමික හා සාමාජික ඉතිහාසය
- ශ්‍රී ලංකාවේ මූර්ති චිත්‍ර හා කැටයම්
- පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන : වෙහෙර විහාර හා ගොඩනැගිලි ආදියෙහි ගෘහ නිර්මාණ ලක්ෂණ, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා ඒ කෙරෙහි ඇති වූ විවිධ බලපෑම්
- පුරා විද්‍යාත්මක නව සොයාගැනීම්
- ශ්‍රී ලංකාවේ සමාජ සංස්ථා, ජනශ්‍රැති, සිරිත් විරිත්, අභිචාර විධි, ඇදහිලි ආදී සංස්කෘතික අංග පිළිබඳ දැනුමක් අපේක්ෂිතයි.

### පරිශීලනීය ග්‍රන්ථ

| | | |
|---|---|---|
| 1. **මධ්‍යකාලීන සිංහල කලා** | - | ආනන්ද කුමාරස්වාමි |
| 2. **මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය** | - | විල්හෙල්ම් ගයිගර් |
| 3. **මධ්‍යකාලීන ලංකා සමාජය** | - | එම්. බී. ආරියපාල |
| 4. **සිංහල සමාජ සංවිධාන** | - | රැල්ප් පීරිස් |
| 5. **ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය** | - | විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය 1 වැනි කාණ්ඩ, 1-2 භාග |
| 6. **ශ්‍රී ලංකාවේ ස්තූප** | - | සෙනරත් පරණවිතාන |

************

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන අවසාන (පණ්ඩිත) විභාගය

ප්‍රශ්න පත්‍ර හතර (4) යි.

## 1 වැනි පත්‍රය - පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ

1. **දීඝනිකාය - පහත සඳහන් සූත්‍ර.**
   i. **බ්‍රහ්මජාල සුත්ත** (බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, ප්‍රථම භාගය, 2 - 80 පිටු).
   ii. **කූටදන්ත සුත්ත** (බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, ප්‍රථම භාගය 248 - 323 පිටු,
   iii. **මහානිදාන සුත්ත** (බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, ද්විතීය භාගය, 80 - 109 පිටු),

2 **විනයවිනිච්ඡය - මුල සිට සංඝාදිසෙස අවසනට**

3 **සුත්තනිපාත - උරගවග්ග**
(සුත්තනිපාත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, 06 - 67 පිටු),

4 **විසුද්ධිමග්ග - 1, 2, 3, 4, 5 නිද්දේස (මුල සිට බන්ධනිද්දෙසය අවසනට)**
(විසුද්ධිමග්ගො, සංස්කරණයඃ පමුණුවේ බුද්ධදත්ත හිමි,හේවාවිතාරණ අට්ඨකථා මුද්‍රණය, කොළඹ, 1991, (1 - 87 පිටු)

5 **අභිධම්මත්ථසංගහ - සම්පූර්ණයෙන්**

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, නියමිත කොටස්වල අර්ථාවබෝධය, ධර්මවිනය ඥානය, සාහිත්‍යමය අගය, ඓතිහාසික, සංස්කෘතික හා සාමාජික පසුබිම යන කරුණු පිළිබඳ ව විස්තරාත්මක දැනුමක් අපේක්ෂිත යි.

### පරිශීලනීය ග්‍රන්ථ

1. **ත්‍රිපිටක පරීක්ෂණය**, පූජ්‍ය හිත්තැටියේ උදිත හිමි, මාතර, 1956.
2. **පාලි සාහිත්‍යය,** පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2002.
3. **පාලි සාහිත්‍යයේ ඉතිහාසය**, හරතසිංහ උපාධ්‍යාය, පරිවර්තනයඃ පූජ්‍ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
4. **ලංකා පාලි සාහිත්‍යය**, ජී. පී. මලලසේකර, ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1964.
5. **විනයවිනිච්ඡයටීකා**
6. **සුමංගලවිලාසිනී (දීඝනිකායට්ඨකථා)**, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1972.
7. **අභිධර්ම චන්ද්‍රිකා**, මාතර ධම්මවංශ හිමි.
8. **අභිධර්ම විභාවිනි ටීකාව**

## 2 වැනි පත්‍රය - පාලි භාෂාව, භාෂා ඉතිහාසය හා පද්‍ය රචනය

(අ) පාලි භාෂාවේ ප්‍රභවය, වර්ධනය හා ව්‍යාප්තිය, පාලි භාෂාවේ නිජබිම පිළිබඳ විවිධ මත, පුරාණ හා මධ්‍ය ඉන්දු ආර්ය භාෂා අතර පාලියට අයත් තැන, පාලිය ලිඛිත භාෂාවක් බවට පත් වූ ආකාරය, පාලි භාෂාව පිළිබඳ යුග වර්ගීකරණය සහ එම යුගයන්ට ආවේණික විශේෂ භාෂා ලක්‍ෂණ, පාලියෙහි විද්‍යමාන වෛදික හා ප්‍රාකෘත භාෂා ලක්‍ෂණ, වර්ණමාලාවේ ක්‍රමවිකාශය, මාතෘභාෂාගත ශබ්ද පරිණාමය වීමේ දී උපයුක්ත ස්වරභක්තිය, සමීකරණය, සම්ප්‍රසාරණය, සංකෝචනය, වර්ණවිපර්යාසය, අපචය, උපචය ආදි පරිණාම සාධක යන මාතෘකාවලට විශේෂ අවධානය යොමු කරමින් පාලි ඓතිහාසික ව්‍යාකරණය පිළිබඳ ව විචාරාත්මක සවිස්තර දැනුමක් මෙහි දී අපේක්ෂිත යි.

(ආ) කච්චායන ව්‍යාකරණය හෝ මොග්ගල්ලායන ව්‍යාකරණය ඇසුරින් පාලි භාෂාවේ වර්ණමාලාව, සන්ධි, නාම, නිපාත, උපසර්ග, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, විශේෂණ විශේෂ්‍ය, කාරක ප්‍රයෝග හා පාලි වාක්‍ය ක්‍රම යන මාතෘකාවලට විශේෂ අවධානය යොමු කරමින් සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණය පිළිබඳ ව විග්‍රහාත්මක දැනුමක් අපේක්ෂිත යි.

(ඇ) දෙනු ලබන මාතෘකාවක් අනුව තෝරාගත් නිර්දිෂ්ට වෘත්තයකට අනුව පාලි පද්‍ය රචනයක් නිර්මාණය කිරීමේ කුශලතාව පරීක්ෂා කරනු ලැබේ.

### පරිශීලනීය ග්‍රන්ථ


1. **කච්චායන ව්‍යාකරණය**, සංස්කරණය: පූජ්‍ය වැගම පියරතන හිමි, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.
2. **මොග්ගල්ලායන ව්‍යාකරණය**, සංස්කරණය: පූජ්‍ය හෙය්යන්තුඩුවේ දෙවමිත්ත හිමි, ලංකාභිනව මුද්‍රණාලය, කොළඹ.
3. **පාලි භාෂාව හා රචනය**, පූජ්‍ය පැණිහෙල සිරි සම්බෝධි හිමි, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ.
4. **පාලි භාෂාව හා වාග්විද්‍යාව**, පූජ්‍ය ගලගෙදර පඤ්ඤානන්ද හිමි, කොළඹ.
5. **පාලි භාෂා විමර්ශනය**, පූජ්‍ය කන්නිමහර සුමංගල හිමි, කොළඹ.
6. **පාලි ව්‍යාකරණ අධ්‍යයන**, පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2011.
7. **පාලි ව්‍යාකරණය**, විල්හෙල්ම් ගෛගර්, (පරිවර්තනය: චන්ද්‍රා වික්‍රමගමගේ), කොළඹ, 1978.
8. **පාලි ව්‍යාකරණය**, වී. පෙර්නියෝලා, (පරිවර්තනය: ඩබ්ලිව්. එස්. කරුණාතිලක), කොළඹ, 1966.
9. **විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය**, පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, කොලිටි ප්‍රින්ටර්ස්, පැඟිරිවත්ත, නුගේගොඩ, 2008.
10. **තුලනාත්මක වාග් විද්‍යාව**, ආනන්ද ජයසේකර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ, 2000, (දෙවන මුද්‍රණය).
11. **A comparative Grammar of Middle Indo-Aryan Languages**, Sen Sukumar, Poona, 1960.

# 3 වැනි පත්‍රය - පාලි සාහිත්‍ය ඉතිහාසය

(අ) **දේශනා පාලි**

දේශනා පාලියට අයත් සූත්‍ර, විනය හා අභිධර්ම යන ත්‍රිපිටක සාහිත්‍යයේ ව්‍යූහය සහ අන්තර්ගතය පිළිබඳ හැඳින්වීම, සූත්‍ර පිටකයේ විෂය හා ශෛලිය, විශේෂයෙන් ඛුද්දක නිකායේ ස්වරූපය හා විවිධත්වය, විනය පිටකයේ ආරම්භය හා විකාශය, සූත්‍රාගත විනය, විනය පිටකයේ ප්‍රභේද, අභිධර්මයේ ආරම්භය හා සංවර්ධනය, අභිධර්ම පිටකයෙන් නිරූපිත අභිධර්ම න්‍යාය යන කරුණු අධ්‍යයනය කිරීම මෙහි දී අපේක්ෂිත යි.

(ආ) **ටීකා පාලි**

පාලි ටීකා සාහිත්‍යයෙහි ප්‍රභවය හා සංවර්ධනය, ටීකා රචනයේ අරමුණු හා ටීකාවන්හි මූලාශ්‍රය, ටීකාචාර්යවරු හා ඔවුන්ගේ කෘති, ටීකා වර්ගීකරණය, ටීකාවන්හි උපයුක්ත අර්ථකථන ක්‍රමවේද, අධ්‍යයන මූලාශ්‍රයයන් අතර ටීකාවන්හි වැදගත්කම, අට්ඨකථා හා ටීකාවන්හි ඇති සම විෂමතා යන කරුණු අධ්‍යයනය කිරීම මෙහි දී අපේක්ෂිත යි.

(ඇ) **ප්‍රකරණ පාලි**

පාලි ප්‍රකරණ සාහිත්‍යය පිළිබඳ ව මූලික හැඳින්වීම, ප්‍රකරණ යන්නෙහි අර්ථ නිරූපණය, ත්‍රිපිටකාගත ප්‍රකරණ ග්‍රන්ථ පිළිබඳ දැනුමක් මෙහි දී අපේක්ෂිත යි.

(ඈ) **පාලි කාව්‍ය හා වෙනත් කෘති**

පාලි භාෂාවෙන් රචිත කාව්‍ය ග්‍රන්ථ, ව්‍යාකරණ හා වෛද්‍ය ග්‍රන්ථ පිළිබඳව විචාරාත්මක දැනුමක් මෙහි දී අපේක්ෂිත යි.

**පරිශීලනීය ග්‍රන්ථ**


1. **දිඹුලාගල ආචාර්ය පරම්පරාව හා පාලි සාහිත්‍යය**, පූජ්‍ය ගෝණදෙනියේ පඤ්ඤාරතන හිමි, නිශාන්ත ප්‍රින්ටර්ස්, දෙල්කඳ, 2010.
2. **පාලි ව්‍යාකරණ සාහිත්‍යය**, පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2011.
3. **පාලි සාහිත්‍යය**, පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2002.
4. **පාලි සාහිත්‍යයේ ඉතිහාසය**, භරතසිංහ උපාධ්‍යාය, පූජ්‍ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි (පරිවර්තනය), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2003.
5. **ප්‍රාචීන ශාස්ත්‍රීය සංග්‍රහය** කලාප (අදාල ලිපි)
6. **ලංකා පාලි සාහිත්‍යය,** ජී. පී. මලලසේකර, ගුණසේන මුද්‍රණාලය, කොළඹ.
7. **ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්,** පූජ්‍ය කහටපිටියේ රාහුල හිමි, හොරණ විද්‍යාරත්න මුද්‍රණාලය, හොරණ.

# 4 වැනි පත්‍රය - ප්‍රාකෘත

## 1 කොටස - නිර්දිෂ්ට ග්‍රන්ථ

1. **උත්තරාධ්‍යයනය** - 10 - 15 පරිච්ඡේද
2. **ගාථාසත්තසතී** - ශතක 1
3. **අශෝක ලිපි (ප්‍රාකෘත)** - 12 සහ 13 වන ගිරි ලිපි
4. **සේතුබන්ධ මහාකාව්‍යය** - 5, 6 ආශ්වාසක

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, නියමිත කොටස්වල අර්ථාවබෝධය, සාහිත්‍යමය අගය, භාෂා ලක්ෂණ, ඓතිහාසික, සංස්කෘතික හා සාමාජික පසුබිම පිළිබඳ ව විස්තරාත්මක දැනුමක් අපේක්ෂිත යි.

## 2 කොටස - ප්‍රාකෘත ව්‍යාකරණ

ප්‍රාකෘත ප්‍රකාශය ඇසුරෙන් මහාරාෂ්ට්‍රී ප්‍රාකෘතයෙහි ස්වර, ව්‍යඤ්ජන හා සංයුක්ත ව්‍යඤ්ජන පරිණාමය, නාම හා ආඛ්‍යාත වරනැඟීම, ධාත්වාදේශ හා නිපාත යන ව්‍යාකරණ විධි පිළිබඳ දැනුමක් ද, පෛශාචී, මාගධී හා ශෞරසේනී යන ප්‍රාකෘත භාෂාවන්හි මූලික ලක්ෂණ පිළිබඳ දැනුමක් ද අපේක්ෂිත යි.

### පරිශීලනීය ග්‍රන්ථ


1. **අශෝක ශිලාලේඛන**, පූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහානාහිමි, කොළඹ, 1988.
2. **උත්තරාධ්‍යයනය** (10 - 15), සංස්කරණය: පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි, පුබුදු ප්‍රින්ටර්ස්, කඳාන, 2007.
3. **ගාථාසත්තසතී**, පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි, සමයවර්ධන, 2007.
4. **ප්‍රාකෘත ප්‍රකාශය**, සංස්කරණය: පූජ්‍ය බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්තිතිස්ස නාහිමි, සමයවර්ධන, 1972.
5. **ප්‍රාකෘත භාෂා සාහිත්‍යය**, පූජ්‍ය කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නාහිමි, කොළඹ.
6. **ප්‍රාකෘත සංග්‍රහය**, ඩී. ඊ. හෙට්ටිආරච්චි, කොළඹ, 1964.
7. **සේතුබන්ධ මහාකාව්‍යය**, පූජ්‍ය කහඳාමෝදර පියරතන හිමි, කොළඹ, 1968.
8. A Comparative Grammar of Middle Indo Aryan, Sen Sukumar, Poona, 1960.
9. An Introduction to Prakrits, A.C. Woolner, 1985.

# ප්‍රාචීන විභාග විෂය නිර්දේශය

# ප්‍රාචීන අවසාන (පණ්ඩිත) විභාගය
# සංස්කෘත විෂයය

ප්‍රශ්න පත්‍ර හතර (04) යි

## 1 වැනි පත්‍රය - සංස්කෘත නිර්දිෂ්ට ග්‍රන්ථ

| | | | |
|---|---|---|---|
| 1. | **ඍග්වේද** | - | i මණ්ඩලයේ 1 අග්නි<br>ii මණ්ඩලයේ 12 ඉන්ද්‍ර<br>vii මණ්ඩලයේ 86 වරුණ<br>x මණ්ඩලයේ 129 ප්‍රජාපති |
| 2. | **කුමාරසම්භව** | - | 3, 4, 5 සර්ග |
| 3. | **කාදම්බරී** | - | උත්තර පීඨිකා |
| 4. | **අභිඥානශාකුන්තල** | - | සම්පූර්ණ පොත |

**5. ජේතවනාරාම සංස්කෘත පුවරු ලිපිය හා තිරියාය සංස්කෘත පර්වත ලිපිය**

නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය, නියමිත කොටස්වල අර්ථාවබෝධය, සාහිත්‍යමය අගය ඓතිහාසික හා සාමාජික පසුබිම යන කරුණු පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂා කෙරේ.

### පරිශීලනිය ග්‍රන්ථ :

| | | | |
|---|---|---|---|
| 1. | **ඍග්වේද ගීතාවලි** | - | නාරාවිල පැට්‍රික් |
| 2. | **ඍග්වේද සමීක්ෂා** | - | ගුණපාල සේනාධීර |
| 3. | **කුමාර සම්භව සමීක්ෂා** | - | පූජ්‍ය මැටිකොටමුල්ලේ දේවානන්ද නාහිමි |
| 4. | **Sanskrit Litriture** | - | Rev. Dr.D. Pannasare Thero |

## 2 වැනි පත්‍රය - භාෂාව ඉතිහාසය හා පද්‍ය රචනය

(අ) 1. මූල ඉන්දු යුරෝපීය භාෂාව හා එහි අනු ශාඛා

2. ඉන්දු ඉරාණීය භාෂා ගණය

3. භාරතීය ශික්ෂා ප්‍රාතිශාඛ්‍ය සම්ප්‍රදායය

4. ඉන්දු ඉරාණීය හා වෛදික භාෂා කාව්‍ය සංස්කෘතය තෙක් භාෂාව පරිණාමය වූ ආකාරය හා පරිණාම රීති යන කරුණු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂිතයි

(ආ) දෙනු ලබන මාතෘකාවට අනුව තෝරාගත් වෘත්තයකිනක් පද්‍ය පහකට නොඅඩු පද්‍ය රචනයක් දේව නාගරී අකුරින් ලිවීම

### පරිශීලනිය ග්‍රන්ථ :

| | | | |
|---|---|---|---|
| 1. | **ආධුනික සංස්කෘත ව්‍යාකරණය** | - | මැක්ඩොනල්ඩ් |
| 2. | **තුලනාත්මක වාග් විද්‍යාව** | - | ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර |
| 3. | **සිංහල භාෂාවේ ප්‍රභවය හා පරිණාමය** | - | විමල් ජී. බලගල්ලේ |

# 3 වැනි පත්‍රය - සාහිත්‍ය ඉතිහාසය

(අ) වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්, වේදාංග, වීරකාව්‍ය හා පුරාණ ග්‍රන්ථ ඇතුළු සාහිත්‍යාංග පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂිතයි.

(ආ) පද්‍ය, ගද්‍ය හා චම්පු කාව්‍ය, උපදේශ කාව්‍ය, ශතක කාව්‍ය, වෛද්‍ය හා ජ්‍යොතිෂ ග්‍රන්ථ හා කෝෂ ග්‍රන්ථ ඇතුළු සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ විශේෂ දැනුමක් අපේක්ෂිතයි.

(ඇ) දෘශ්‍ය කාව්‍ය සාහිත්‍ය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක් අපේක්ෂිතයි.

**පරිශීලනිය ග්‍රන්ථ :**

1. **සංස්කෘත වෛදික සාහිත්‍ය** - ජයදේව තිලකසිරි
2. **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය** - ජයදේව තිලකසිරි
3. **සංස්කෘත නාට්‍ය සාහිත්‍යය** - ජයදේව තිලකසිරි
4. **සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය** - බෙරිඩේල් කීත්.
   (පරිවර්තනය : ජී. එස්. බී. සේනානායක)
5. **සංස්කෘත කෝෂ සාහිත්‍ය** - ජිනසෝම වීරසූරිය
6. **සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය** - ජී. එස්. බී. සේනානායක
7. **නිඝණ්ඩු සාහිත්‍යය** - ආනන්ද අබේසිරිවර්ධන
8. **සංස්කෘත සාහිත්‍යය** - පූජ්‍ය දෙහිගස්පේ පඤ්ඤාසේඛර හිමි

# 4 වැනි පත්‍රය - තර්ක න්‍යාය

1. **තර්ක සංග්‍රහ**
2. **න්‍යාය බින්දු**

(අ) යන ග්‍රන්ථ වල අන්තර්ගත කරුණු පිළිබඳ විස්තරාත්මක දැනුමක් ද තර්ක, න්‍යාය, වෛශේෂික, සාංඛ්‍ය, යෝග, මීමංසා සහ උද්ගාමී, නිගාමී තර්ක ශාස්ත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ද අපේක්ෂිතයි.

(ආ) භාරතීය තර්ක න්‍යාය සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ විචාරාත්මක දැනුමක් අපේක්ෂා කෙරේ.

**පරිශීලනිය ග්‍රන්ථ :**

1. **භාරතීය දර්ශන** - පූජ්‍ය නාරාවිල ධම්මරතන හිමි
2. **තර්ක සංග්‍රහ විවරණ** - පූජ්‍ය වරාගොඩ සීලරතන හමි
3. **තර්ක සංග්‍රහ ව්‍යාඛ්‍යා** - පූජ්‍ය ආචාර්ය දික්වෙල පියනන්ද හිමි
4. **න්‍යාය බින්දු** - පූජ්‍ය කරහම්පිටිගොඩ සුමනසාර හිමි
5. **න්‍යාය බින්දු** - පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
6. **නවීන තර්ක ශාස්ත්‍රය හා භාරතීය තර්ක ශාස්ත්‍රය** - පූජ්‍ය අල්පිටියේ ඤාණේස්වර හිමි සහ ආර්.ඩී.ගුණරත්න
7. **මධ්‍යම උපාධි තර්ක ශාස්ත්‍රය** - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව